# නවයුගයට අහිමි වන වටිනා ජීවීන්

ලොව හැම දෙයක් ම අනියත ය. උපත ලබනා හැම කෙනෙකුට ම මරණය පොදු ය. මිනිසාට මෙන් ම හැම ශාකයකට ම සතකුට ම පොදු ධර්මතාවකි එය. එහෙත් කිසියම් සත්ත්ව හෝ ශාක විශේෂයක් ලොවෙන් සම්පූර්ණයෙන් වඳව යාම සාමාන්‍ය දෙයක් නොවේ.

ශාක හා සතුන් වඳ වී යාමත් නව විශේෂ පරිණාමයට පත්වීමත් ජීවය ආරම්භ වූ ද සිට ම සිදු වූ ක්‍රියාදාමයකි.

එහෙත් මෙසේ වඳ වී යන සතුන් පිළිබඳ මිනිසාගේ අවධානය යොමු වූ බව සඳහන් ප්‍රථම අවස්ථාව (ලිඛිත) වන්නේ 1894 දී ඇමරිකාව විසින් ප්‍රකාශයට පත් කළ මී ගවයන් සුරැකීමේ පණත ය. සියවස් ගණනාවක් තිස්සේ උතුරු ඇමරිකාවේ සැරිසැරූ අතිවිශාල මී ගවයන් රංචු 1800 මුල් දශකය වන විට අතේ ඇඟිලි ගණනට අඩු වී ගියේ ය. මේ නීතිය ගෙන එනු ලැබුවේ එසේ වැනසී යන සතුන් සුරකිනු පිණිස ය. ඉන් පසු සතුන් සුරැකීමේ පණතක් එළිදුටුවේ 1900 දී ය. ඒ පක්ෂීන් හා ක්ෂීරපායීන් ඇමරිකාවෙන් පිටරට යැවීම තහනම් කරන පණතකි. ඉන්පසු වඳ වී යන සතුන් සුරැකීම පිණිස ඉදිරිපත් වූ වැදගත්ම පණත 1973 දී පැණවූ වඳ වී යන විශේෂ පිළිබඳ ප්‍රඥප්තිය යි. එයින් කෙරුණේ වඳ වී යන බව සඳහන් සතුන් හෝ ශාක මරා දැමීම, තුවාල කිරීම හෝ ප්‍රවාහනය තහනම් කරලීම ය. මසුන්ගේ තත්ත්වය සැලකුවහොත් ඇමරිකාවේ පමණක් විශේෂ 100 ක් පමණ වඳ වී යාමේ අනතුරට මුහුණ දී සිටිති.

උරගයන් හා උභයජීවීන් සැලකුවහොත් විශේෂ 130 ක් පමණ ම වඳ වී යන්නට ආසන්න ය. කිඹුල් හා කැස්බෑ විශේෂ ද ඊට ඇතුළත් ය. ලොව වෙසෙන ක්ෂීරපායීන්ගෙන් විශේෂ 340 ක් පමණ මේ අනතුරට මුහුණ දී සිටිති. තල්මස් විශේෂ අටක්, වඳුරන්, මුවන් විශේෂ 20 ක් අලි හා කොටි ද මීට ඇතුළත් වෙති. ලොව වැඩිපුරම ව්‍යාප්ත වී සිටින සත්ත්ව වර්ගයක් වන ඉන්සෙක්ටාවන්ගේ විශේෂ 36 ක් පමණ වඳවී යාමට ආසන්න ය. ලස්සන සමනල විශේෂ ද මීට ඇතුළත් ය. එසේ වඳ වී යාමට ආසන්න විවිධ වංශ හා වර්ග කළ විශේෂ කීපයක් මේ සමග වන සටහනක දැක් වේ.



ඉදිරියේ දී අන්තරායට ලක් වීමට ඉඩ ඇති ආසියාතික අලි පරපුර

පෘථිවිය මත ජීවත්වන ශාක සහ සත්ත්ව විශේෂ මිලියන ගණනක් අතුරෙන් මිනිසා, එක් විශේෂයක් පමණි. මිනිසාට මෙන්ම අනෙකුත් සියලුම ජීවීන්ට ද පෘථිවිය මත ජීවත්වීමේ සමාන අයිතියක් ඇත. එනිසා මිහිතලයෙන් වෙනත් විශේෂයක් තුරන් වී යෑම සඳහා මිනිසාගේ ක්‍රියා හේතු නොවිය යුතුය. එසේම යම් යම් ජීවීන් අනාගත පරම්පරාවලට ද දැක ගැනීමට ඇති අයිතිය, අප උදුරා නොගත යුතු ය. කෙසේ වෙතත් මිනිසාගේ බලපෑම් නිසා අද සතුන් සහ ශාක විශේෂ රැසක් වඳ වී යෑමේ තර්ජනයට මුහුණ පා ඇත.

ජීව විශේෂ වඳවී යෑමට හේතුවන මිනිස් ක්‍රියා අතර එම ජීවීන්ගේ වාසස්ථාන විනාශ කිරීම ප්‍රධාන තැනක් ගනී. මිනිස් ජනපද, කෘෂිකාර්මික බිම්, පතල් සහ වරාය ඇති කිරීම ආදී ක්‍රියා නිසා ජීවීන්ගේ වාසස්ථාන අධික වශයෙන් විනාශ වේ. එසේ ම වේලි බැඳීම, වනාන්තර එළි පෙහෙලි කිරීම, රසායන ද්‍රව්‍ය මගින් වාතය, පස, ජලය දූෂණය කිරීම, භූගත ජලය අධික ලෙස නිස්සාරණය කිරීම, ඉන්ධන නිස්සාරණය කිරීම සහ දහනය, පාංශු ඛාදනය ආදිය ද ජීවීන්ගේ වාසස්ථාන විනාශ කිරීම සඳහා හේතු කාරක වේ. ජීවි විශේෂ සංරක්ෂණය සඳහා එම විශේෂවල වාසස්ථාන ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය ය. ශ්‍රී ලංකාවේ අලි, මෙසේ වාසස්ථාන විනාශ වීම නිසා වඳ වී යෑමේ තර්ජනයට මුහුණ පා ඇති සත්ත්ව විශේෂයකට නිදසුනකි.

**ලොවෙන් වඳ වී ගිය ජීවීන්**



**තස්මේනියානු වෘකයා**
**Tasmanian Wolf**
***(Thylacinus cynocephalus)***



**මගී පරවියා**
**Passenger Pigeon**
***(Ectopistes migratorius)***

ජීවි විශේෂවල අධිපරිභෝජනය ද ඔවුන් වඳ වී යෑමට හේතුවක් වී ඇත. ශ්‍රී ලංකාව ඇතුළු නිවර්තන කලාපික මුහුදුවල ජීවත් වන කැස්බෑ විශේෂ (නි. ගල් කැස්බෑවා, බටු කැස්බෑවා, පොතු කැස්බෑවා, දර කැස්බෑවා, ඔළුගෙඩි කැස්බෑවා) මෙසේ මිනිසා විසින් අධිපරිභෝජනය කරනු ලැබීම නිසා වඳ වී යෑමේ තර්ජනයට මුහුණ පා ඇති සතුන්ට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

විදේශික විශේෂ හඳුන්වා දීම ද යම් යම් දේශීය විශේෂවල වඳ වී යෑමට හේතුවක් වී ඇත. ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද ට්‍රවුට් මත්ස්‍යයා නිසා කඳුකර ප්‍රදේශයේ දිය පාරවල ජීවත් වන කූනිස්සන් විශේෂයක් වඳවී යෑමේ තර්ජනයට මුහුණ පා සිටීම මීට නිදසුනකි.

පසුගිය වසර 10 තුළ හෝ පරම්පරා 3 ක් තුළ හෝ යන දෙකින් වඩාත් දීර්ඝ කාලය තුළ ජීවීන් සංඛ්‍යාව අවම වශයෙන් 80% කින් අඩුවීම, ජීවත් වන ප්‍රදේශ $100 km^2$ ට වඩා අඩුවීම, පරිණත ජීවීන් සංඛ්‍යාව 50 ට වඩා අඩුවීම,

19 පිටුවට

# නවයුගයට අහිමි වන ...

## කවරයේ ඇතුළු පිටුවෙන්

ඊළඟ වසර 10 හෝ පරම්පරා 3 හෝ යන දෙකින් වඩාත් දීර්ඝ කාලය තුළ ස්වභාවික පරිසරයේ වඳ වී යෑම සඳහා 50% ක සම්භාවිතාවක් තිබීම යන කරුණුවලින් එකක් හෝ නිසා ස්වභාවික පරිසරයේ දී වඳ වී යාමේ ඉතා ම අධික අවදානමකට මුහුණ පා ඇති විශේෂ අතිශයින් අන්තරායට ලක් වූ(critically endanged)විශේෂ ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ නිල්වලා ගඟ ආශ්‍රිත කුඩා දිය පාරක ජීවත් වනDanio pathirana නම් මිරිදිය මත්ස්‍යයා මීට නිදසුනකි.

පසුගිය වසර 20 තුළ හෝ පරම්පරා 5 ක් තුළ හෝ යන දෙකින් වඩාත් දීර්ඝ කාලය තුළ ජීවීන් සංඛ්‍යාව අවම වශයෙන් 50% කින් අඩුවීම, ජීවත් වන ප්‍රදේශය 500$km^2$ට වඩා අඩු වීම, පරිණත ජීවීන් සංඛ්‍යාව 250 ට වඩා අඩු වීම ඊළඟ වසර 10 හෝ පරම්පරා 3 හෝ යන දෙකින් වඩාත් දීර්ඝ කාලය තුළ ස්වභාවික පරිසරයේ වඳවී යෑම සඳහා 20% ක සම්භාවිතාවක් තිබීම යන කරුණුවලින් එකක් හෝ නිසා ස්වභාවික පරිසරයේ දී වඳවී යෑමේ ඉතා අධික අවදානමකට මුහුණ පා ඇති එනමුත් අතිශයින් අන්තරායට ලක් නොවූ විශේෂ අන්තරායට ලක් වූ (endangered) විශේෂ ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාව ආශ්‍රිත මුහුදේ ජීවත් වන සියලු ම කැස්බෑ විශේෂ මෙම කාණ්ඩයට අයත් සතුන්ට නිදසුන් ය.

පසුගිය වසර 10 තුළ හෝ පරම්පරා 3 ක් තුළ හෝ යන දෙකින් වඩාත් දීර්ඝ කාලය තුළ ජීවීන් සංඛ්‍යාව අවම වශයෙන් 20% කින් අඩුවීම, ජීවත් වන ප්‍රදේශය 20000$km^2$ ට වඩා අඩු වීම, පරිණත ජීවීන් සංඛ්‍යාව 1000 ට වඩා අඩු වීම, ඊළඟ වසර 100 තුළ ස්වාභාවික පරිසරයේ වඳ වී යෑම සඳහා 10% ක සම්භාවිතාවක් තිබීම යන කරුණුවලින් එකක් හෝ නිසා ස්වභාවික පරිසරයේදී වඳ වී යෑමේ අධික අවදානමකට මුහුණ පා ඇති, එනමුත් අතිශයින් අන්තරායට හෝ අන්තරායට හෝ ලක් නොවූ විශේෂ අන්තරායට ලක් වීමට ඉඩ ඇති (vulnerable) විශේෂ ලෙස හැඳින් වේ.

ආසියාතික අලියා (Elephas maximas) හා ශ්‍රී ලංකාවේ ජීවත් වන උනහපුළුවා(Loris tardigradus) මෙම කාණ්ඩයට අයත් වෙති.

ඉහත කාණ්ඩවලට අයත් නැති, නමුත් අනාගතයේ දී අන්තරායට ලක් වීමට ඉඩ ඇති පැවැත්ම සඳහා සංරක්ෂණයක් අවශ්‍ය විශේෂ දුර්ලභ විශේෂ ලෙස හැඳින් වේ. ශ්‍රී ලංකාවේ ජීවත් වන පිඹුරා සහ අලංකාර මිරිදිය මත්ස්‍යයෙකු වන බුලත්හපයා මීට නිදසුන් දෙකකි.

***1980 දශකයේ අග භාගය වන විට ශ්‍රී ලංකාවේ අන්තරායට ලක් වූ අන්තරායට ලක් වීමට ඉඩ ඇති සහ දුර්ලභ යන කාණ්ඩවලට අයත් වන සත්ත්ව විශේෂ සංඛ්‍යා වගුවේ දැක්වේ.*** ❑

ක්‍රොම්ටන් ශබ්දකෝෂය හා මහාචාර්ය ජේ. විජයරත්නයන්ගේ පරිසර විද්‍යා පොත ඇසුරෙනි.

ලොව වඳ වීමේ තර්ජනයට මුහුණ පා සිටින ජීවීන් - කවරයේ පසු පිටුවේ.

| සත්ව කාණ්ඩය | මුළු විශේෂ සංඛ්‍යාව | ආවේණික විශේෂ සංඛ්‍යාව |
|---|---|---|
| කෘමීහු | 40 | 20 |
| ක්‍රස්ටාසෙයාවෝ | 16 | 10 |
| මොලුස්කාවෝ | 13 | 12 |
| මත්ස්‍යයෝ | 16 | 14 |
| උභයජීවීහු | 22 | 29 |
| උරගයෝ | 94 | 72 |
| පක්ෂීහු | 57 | 17 |
| ක්ෂීරපායීහු | 31 | 12 |